


ඒ ○○○○○ අවුරුද්දේ මැය් මාසෙ ○○ වෙනිදා් හිමිදිරි පාන්දර. කුස්සිය පැත්තේ ගාන්දාර හඬක් ඇසී මම අවදි වුයෙමි. ඇඳේ ම ඉඳගෙන ඒ සද්දය කුමක් විය හැකි දැය් සිතුවෙමි. පහේ කෝච්චිය යන හඬ ඇසුනේ එවිටයි.

මේ මහ වරුසාව දවසෙ තවත් ටිකක් වෙලා් නිදා නොගෙන මේ මනුස්සයා කරන විගඩම කුමක් ද? අද විසේස වැඩක් හෝ ගමනක් වත් යොදා ගෙන තියනවා ද? මම මඳක් කල්පනා කළෙමි. මිහ්... නැත. ච් වැන්නක් ගැන මට කල්පනාවක් නැත. මට මහත් පහලුවකි (Pzzel)

"සිරියාවතී හාමිනේ මොකෝ මේ වරුසාව දවසෙ හිමිදිරි පාන්දර යුද්ද්‍රාබියාසයක් පටං අංරං?" මම ඇඳේ සිට කෙඳිරි ගෑවෙමි.

"ංආ ඔයා අවදි වෙලා ද? ගුට් මෝනිං.! ගුට් මෝනිං.! ඒ උනාට කමක් නෑ.. තව ටිකක් සිරි යහනාවෙම සැතපිලා ඉන්න.. මම් මේ පොඩි වැඩක්.. ඒ වැඩේ ඉවර වෙලා් මම් බුලත් අතකුත් අරං එන්නං අපේ අප්පුහාමි මහත්තයට ආරාදනාවක් කරන්නට තියනවා්."

"ය් යකෝ මේ ගෑනි ට අද බූතයෙක් වැහිලා් ද? නැත් නං හීනයක්.."

"මේ මේ කට පියා ගෙන තව ටිකක් නිදා ගන්නය් කීවේ. ඇහු නා.. ආ ය් ?"

සිරියාවතී හාමිනේ නිකම්ම නිකම් ජෝක් දානා බඩුවක් නොවේ. මොකාක් හරි මං නොදන්නා දෙයක් තිබිය යුතු ය. මම යලිත් දහ අතේ කල්පනා කළෙමි. මිහ්.. මට හිතා ගත නොහැකි ය.

හිතට වද මේන් තව දුරටත් මට ඇඳේ රැඳී සිටිය නොහැකි ය. මම නැඟී ඇඳේ ඉඳ ගතිමි. මගේ ඇඳා ගෙප්පි බැඳපු කෙනෙක් වැනි ය. ඒකා ගේ සද්දෙට සිරියාවතී හාමිත් යලිත් සීනුව හඬවන්නට වූවා ය.

"මං ඔහේට එක පාරක් කිව්වා හොඳ ලමයා් වාගේ තව ටිකක් වෙලා් නිදාගන්න කියලා.. මං කිරි එක හදාගෙන එනකං.. මං මේ සූප්පුව හොයා ගන්න බැරුව .. අනේ මන්දා්.. ඒක මීයො ගෙනිහිං ද දන්නෑ"

මම හිනාව තද කරගෙන සිටියෙමි. ඇඳ හෑල්ලු කලෙමි.හිමීං කුස්සියට ඇදුනෙමි. මගේ පැමිනීමෙන් සිරියාවතී හාමිනේ ගැස්සුනා ය. ඇය කරමින් සිටි වැඩේ නවත්තා මා ඉදිරියට පැමිනියා ය. කපා හෙලූ කෙහෙල් ගහක් මෙන් මා ඉදිරියේ වැටුනු ඈ මගේ දෙපතුල් අල්ලා ගෙන සිඹින්නට වූවා ය.

"මොනවාහ්..?" මම වහා ඈ නඟා සිටැවීමි. ඇගේ දෑස් කඳුලින් පිරී ඇත.

"මොකද දෙයියනේ... ඔහේට මේ වෙලා තියෙන්නෙ?"

ඇය දෑතින්ම මගේ ගෙල බදාගෙන ඉකි ගසන්නට වූවා ය.

ඔහේට මතක නෑහ්..? මීට හරියටම අව්රුදු පනහකට ඉස්සර අද වගේ දවසක ඔහේ මගේ බෙල්ලට මාලයක් දැම්මා ආ... ආ? ජීවිතාන්තය දක්වා ඔයා ... මග්ගේ .. කීවා්.." ඇයගේ උනුසුම් සුසුම් මගේ ගෙල වටා දැවටෙනු මට දැනේ. මම පිලිමයක් සේ සිටියෙමි.

"එදය් අදය් ඔහේ පන වගේ මට සැලකුවා.. මාත් එහෙමය්.. දෙය්යෙකුට වගේ මං ඔහේට සැලකුවෙ.."

"ංආ ඒකද? මට නං හාංකවිසියක් මතකක් තිබුන්නෑ.. අවීරුදු පනහක්..! සත වර්ස බාගයක්..! දරුවො පස් දෙනෙක්..! මුනුබුරාලා දාසෙය දෙනෙ-ක්... ඔහේට හැත්තෑවය් ලබන මාසෙ! මට හැත්තෑ දෙක ඉවරය්.! ජීවිතේ හැටි.!"

"කෝ .. කෝ .. අන්න බත උතුරනවා්.. මං කිරි බතක් උයනවා්.. ඊයෙ මං දයාවතී ලමයට කියලා් කොන්ඩ කැවුං හදවා් ගත්තා්... අපේ "කැවීමා" කැවුං කන්න හපන් හින්දා්.. මට මතකය් දවසක් කියනවා් හුඟ දොහකින් කැවීං කන්න බැරි උනා කියලා්... මං ඊයෙ කජු බැදුමකුත් හැදුවා්"

මගේ යටි හිතට ලැජ්ජාවක් දැනුනි. අපේ රුවල් නැව දියත් කල දිනය.. අවීරුදු පනහක් පිරෙන දිනය මතක් නූනු හැටි..! ගෑනුංගෙ මතකය... සිහි කල්පනාව අපට වඩා කොච්චර නං ඉහල ද?

මගේ හිතටද නව පනක් ලැබුනු සේ ය. මම මුහුන සෝදා අලුත් සරමකුත් කමිසයකුත් ඇඳ ගතිමි. සිරියාවතී හාමිනේ කිරි බත පෑ ගා හමාර ය. විනාඩියෙන් දෙකෙන් ඇය ද මුහුන සෝදා ඇඳ පැලඳ ගතාතා ය

සුදු අරලිය මල් වට්ටියක් අතින් ගත් ඈ " අපි බුදුං වැඳලා් ම වැඩ අල්ලමු නේද? මට අද පාර්තනාවක් කරන්නත් තියෙනවා්... අපි ආය් උපදිනවා් නං උපෝපං ජාති මං ඔහේගෙ සිරියාවතී වෙන්න..." ඇයට වැකිය ඉවර කල නොහැකි විය. ඇය යලිත් මගේ ඇඟට හේත්තු වූවා ය.

මම ඇගේ නලලත උනුසුම් කලෙමි. ■

සන්නස පිරිවරේ වි ක ධර්මබන්ධු මහතාගේ නැන්දම්මා වූත් බෙ බී ධර්මබන්ධු මහත්මිය ඇතුළු දූ දරුවන් නව දෙනෙකුගේ අම්මා වූත් මාතර නාවිමන කොරටුවේ ගෙදර විසූ දෝන කර්ලිනා විජේසේකර මාතාව අනූපස් වසරක් ආයු වළදා පසු ගිය ඔක් 24 වන දින අපවත් වූවා ය. ඕ මින් තිස් වසරකට පෙර හරියටම ඔක් 24 වැනි දා අපවත් වූ ජේම්ස් අප්පුහාමි වික්‍රමරත්න මහතා ගේ ප්‍රිය භාර්යාව වූවා ය.





